# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15
### 2019 පෙබරවාරි - අප්‍රේල්
### සමාජීයවිද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයනය
### සංවර්ධන භාවිතයන් සඳහා පර්යේෂණ ක්‍රමවේද DVST – E 3025
### (නව නිර්දේශය)

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සංවර්ධන ක්‍රියාවලිය තිරසාරව පවත්වා ගැනීමට පර්යේෂණ මගින් ලැබෙන පිටිවහල අගයන්න. (ලකුණු 20 යි)

02. පර්යේෂණයක් යනු කුමක්දැයි හඳුන්වා සංවර්ධන ක්‍රියාවලියේදී නිතර භාවිතා වන පර්යේෂණ වර්ග තුනක් උදාහරණ මගින් පෙන්වා දෙන්න. (ලකුණු 20 යි)

03. ග්‍රාමීය ප්‍රදේශයක සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී සහභාගීත්ව ගැමි ඇගයුම (PRA) වැදගත්වන ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 20 යි)

04. පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) යනු කුමක්දැයි හඳුන්වා ශ්‍රී ලංකාවේ එය ක්‍රියාත්මක කරන නීතිමය පසුබිම ගෙනහැර දක්වන්න. (ලකුණු 20 යි)

05. පර්යේෂණ යෝජනාවලියක මූලික කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

06. සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි බලපෑම සොයා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) භාවිතා කරන ප්‍රතිඵල මූලික ඇගයීම් (Result based evaluation) ක්‍රියාවලියේ වැදගත්කම අගයන්න. (ලකුණු 20 යි)

07. ව්‍යාපෘතියක සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ව්‍යවහාරික පර්යේෂණ (Applied research) වල ඇති ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 20 යි)

08. නියැදිකරණය යනු කුමක්දැයි දක්වා ප්‍රධාන නියැදි ක්‍රම තුනක් (03) උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

**************************